ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 04 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් පදනම මත ආදායම් ගිණුම්ගත කිරීම දෙපාර්තමේන්තුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වූ අතර, ආදායම් කේතය 1003.07.02 (සමථ මුදල් හා දඩ) යටතේ 2024 වර්ෂයට අදාළව එකතු කරන ලද ආදායම රු.11,619,885ක් වුවත්, වර්ෂය තුළ ඉන්වොයිස් කරන ලද(පැනවීම්) රු.11,898,137ක් වර්ෂයේ එකතුකළ ආදායම ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ එකතුකළ ආදායම රු.278,252කින් වැඩියෙන් දක්වා තිබුණි.	පෙර වසරවල සකස්කර ඇති පරිදි මෙම වසරේ ද 1003:07:02 ආදායම් වාර්තා සකස්කර ඇති අතර, 2025.01.10 දිනැති අංක 01/2025 චක්‍රලේඛයට අනුව හා විගණනයේ දී පෙන්වා දී ඇති පරිදි ඉදිරියේ දී මුදල්වලින් ලද සමථ ආදායම පමණක් ආදායම් ලෙස පදනම්කර ගනිමින් වාර්තා සකස් කරන බව දන්වා තිබුණි.	ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු ය.
(ii)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය මගින් හඳුන්වා දී ඇති ආකෘතිය ප්‍රකාරව වාර්තාකරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් වර්ෂ ආරම්භක ශේෂයක් ද, පසුගිය වර්ෂයට අදාළ හිඟ මුදල් සහ පසුගිය වර්ෂයට පෙර වසර වන විට හිඟ මුදල් වෙනුවෙන් වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිග මුදල් ශේෂයක් ද පැවතිය නොහැකි වුවත්, අදාළ තීරු තුළ පිළිවෙලින් රු.33,061,833ක්,	පසුගිය වසරවල සකස්කර ඇති ආකාරයට මෙම වාර්තාව සකස් කර ඇති අතර, ඉදිරියේ දී විගණනය දැනුම් දුන් පරිදි වාර්තාව සකස්කරන බව දන්වා තිබුණි.	නියමිත ආකෘතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය.

	රු.7,111,533ක් සහ රු.7,386,109ක් ලෙස ශේෂ දක්වමින් හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය නිවැරදි නොවන පරිදි පිළියෙලකර තිබුණි.		
(iii)	2024 දෙසැම්බර් 31 දිනට පැවැතිය හැකි උපරිම හිඟ ආදායම් ශේෂය රු.30,273,522ක් වුවත්, හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙහි හිඟ ආදායම් ශේෂය රු.96,895,102ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම රු.66,621,580කින් වැඩියෙන් දක්වා තිබුණි.	ගිණුමේ ඉදිරිපත්කර ඇති වාර්තාවේ දෝෂයක් හේතුවෙන් මෙය සිදුවී ඇති අතර, ඉදිරියේදී නිවැරදි කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි.	නිවැරදි අගයන් ඇතුළත්කර ආදායම් ප්‍රකාශන පිළියෙල කළ යුතු ය.
(iv)	2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව සහනාධාර හා මාරුකිරීම් වෙනුවෙන් කරන ලද ගෙවීම් රු.18,269,665ක් වුව ද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දරන ලද මුදල් ප්‍රවාහය තුළ රු.18,628,551ක් ලෙස දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.358,886කින් අඩුවෙන් දක්වා තිබුණි.	වැරදීමකින් 1701 යටතේ ණය ශේෂ කපාහැරීම ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති බව පිළිගෙන ඇති අතර, ඉදිරියේ දී මෙවැනි වැරදි ඇති නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය.

(ආ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂය 2106 යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සපයා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ පත්ඉරු පරිලෝකනය සඳහා රු.118,369,366ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණ ද, ඊට අදාළව භාවිතාකළ හැකි පරිදි සංවර්ධනය කර ඇති කිසිදු මෘදුකාංගයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි. එහෙත් විධිමත් ගිණුම්කරණ	පත්ඉරු පරිලෝකනය යනු මෘදුකාංගයක් නොව එය දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන පත්ඉරු සංරක්ෂණය සඳහා කරනු ලබන කාර්යයකි. එය වත්කමක් වන්නේ අනාගතයේ දී පරිලෝකනය කරන ලද පත්ඉරු e-Land මෘදුකාංගයට ඇතුළත්කර ඉන් පිටපත් ලබා දී ආයතනයේ ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස භාවිතා කිරීමට	සාධාරණ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් මූලධන වියදම් ගිණුම් ගත කළ යුතු ය.

ප්‍රතිපත්තියක් හඳුන්වාදීමකින් තොරව වැයකර තිබුණු මුදල මූලධන වත්කම් අත්පත්කර ගැනීමක් ලෙස මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණි.	සැලසුම්කර තිබුණි.	

(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂයට අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2024 වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුව අනුව දෙපාර්තමේන්තුවේ, අත්තිකාරම් "බී" ගිණුම් කටයුතු වෙනුවෙන් අනුමත උපරිම හරශේෂ සීමාව රු.320,000,000ක් වුව ද, නිසිකළමනාකරණයකින් තොරව ණයදීම සහ ණය පවරාගැනීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.15,614,150කින් සීමා ඉක්මවීමක් සිදුවී තිබුණි. මු.රෙ. 503(2) ප්‍රකාරව සීමා ඉක්මවීම් පවතින්නේදැයි හඳුනාගෙන අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ගිණුම් වර්ෂය අවසන් වී දින 41ක් ගතවීමෙන් පසු එනම්, 2025 පෙබරවාරි 10 දින අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ ඉල්ලුම්පත ඉදිරිපත්කර තිබුණි. එම ප්‍රමාදය පිළිබඳව අවධානය යොමුකිරීමකින් තොරව භාණ්ඩාගාරය විසින් 2025 මැයි 22 දින පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණි.	2024.12.31 දිනට ඉක්මවා ඇති රු.15,614,150ක හරශේෂ සීමාවෙන්, රු.12,699,807ක් ස්ථාන මාරු වී පැමිණි (254012) නිලධාරින්ගේ ණයශේෂ පියවන ලද මුදල වන අතර, උපරිම හර ශේෂ සීමාව රු.336,000,000 දක්වා සංශෝධනය කිරීම සඳහා අමාත්‍යාංශය මගින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති අතර, ඒ සඳහා 2025.05.22 දින පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපිළිපැදීමක් සම්බන්ධයෙන් ඉල්ලුම්පත් නියමිත දිනට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු.රෙ. 143(1) ප්‍රකාරව තක්සේරු කිරීමේ නිලධාරියා විසින් රැස්කිරීමට අපේක්ෂිත මුදල් හැකිතාක් දුරට නිවැරදිව තක්සේරු කළ යුතු වුවත්, මූලික ආදායම් ඇස්තමේන්තු නිසිපුරෝකථනයකින් තොරව සකස්කිරීම නිසා වර්ෂය තුළ ලියාපදිංචි කිරීමේ ගාස්තු සියයට 08කින් හෙවත් රුපියල් මිලියන 200කින් වැඩි කිරීමටත්, නොතාරිස්වරුන්ට මහාධිකරණ සහතික නිකුත්කිරීමේ ගාස්තු සියයට 70කින් හෙවත් රුපියල් මිලියන 7,700,000කින් අඩුකිරීමටත් සිදු වී තිබුණි.	විදේශ දූතමණ්ඩල කාර්යයන් සඳහා ලැබෙන ආදායම දෙපාර්තමේන්තුවේ ආදායම් කේතය 1003:07:02 ට බැරකිරීම හේතුවෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු රුපියල් මිලියන 200කින් සංශෝධනය කළ අතර, 2024 වර්ෂය තුළ දී අමාත්‍යාංශය වෙත යවන ලද බලපත්‍රය ඇමතිතුමන් විසින් අත්සන් නොකිරීම, බලපත්‍ර සඳහා නීති උපදෙස් ලැබීම ප්‍රමාදවීමත්, වසරක් පාසා නීති විද්‍යාලවලින් පිටවන සියලුදෙනා එකවර ප්‍රථම බලපත්‍ර ඉල්ලුම් නොකිරීමත්, ප්‍රථම බලපත්‍ර ලබාගත් සියලුදෙනා එකවර අමතර භාෂා ඉල්ලුම් නොකිරීමත්, අධිකරණ කලාප මාරු නොකිරීමත්, වැනි හේතු නිසා ඇස්තමේන්තු කළ රුපියල් මිලියන 11ක ආදායම සංශෝධනයකර ඇති බව දන්වා තිබුණි.	නිසි පුරෝකථනයකින් ඇස්තමේන්තු පිළියෙල කිරීමට වග බලාගත යුතු ය.

(ආ)	සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට පසුගිය වර්ෂය හා ඊට පෙර වර්ෂයන් වෙනුවෙන් පැවති සමථ දඩ හිඟ ආදායම රු.33,061,833ක් ද, සමාලෝචිත වර්ෂයේ දී පැනවීම් රු.11,898,137ක් ද වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයකරගත යුතු මුළු සමථ දඩ ආදායම රු.44,959,970ක් විය. එහෙත් පසුගිය වර්ෂයන්ට අදාළ හිඟ ආදායමින් රු.6,937,620ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණු අතර, එය සියයට 21ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දී පැනවීම්වලින් සියයට 39ක් වූ රු.4,682,265ක් පමණක් අයකරගෙන තිබුණු අතර, අයකර නොගත් සියයට 61ක් වූ රු.7,215,872ක ආදායම හිඟ ආදායමට එකතු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අයකරගත යුතු මුළු සමථ දඩ ආදායමින් මුළු අයකර ගැනීම 11,619,885ක් පමණක් වන අතර, එය සියයට 26ක් වැනි ඉතා පහළ අගයක් ගෙන තිබුණි.	2025 වර්ෂයේ සිට සමථවලින් ලැබෙන ආදායම පමණක් ගිණුම්ගත කරන බැවින්, සමථ ගිණුම්වල හිඟ ආදායම් පෙන්වීමට අවශ්‍යතාවයක් පැන නොනගින බව දන්වා තිබුණි.	ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.
(ඇ)	දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත දෙවන පිටපත් භාරදීම ප්‍රමාද කිරීම හේතුවෙන් නොතාරිස්වරුන්ට නියම කළ වසර ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු නොකළ රු.1,261,422ක සමථ ගාස්තු 2024 දෙසැම්බර් 31 දින වන විටත් හිඟව පැවතුණි.	පෙර පටන් පැවත එන රු.1,261,422.00 ක මුදල සමථ මුදල් ගාස්තුවෙහි හිඟ මුදල් වේ. චක්‍රලේඛ අංක: 01/2025 අනුව හිඟ සමථ මුදල් නොගෙවා ඇති නොතාරිස්වරුන්ගේ බලපත්‍ර අහෝසි කිරීමට කටයුතු සිදුකරනු ලබන අතර, ඇතැම් නොතාරිස්වරු මේ වන විට මුදල් ගෙවමින් පවතී. 2025 ගිණුම්වල හිඟ ශේෂ පෙන්වීමක් නොකරන බව දන්වා තිබුණි.	ආදායම් එකතු කිරීම කාර්යක්ෂම කළ යුතු ය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 04කට අදාළව ප්‍රතිපාදනයන් ඉතිරිව තිබියදීත්, එම වැය විෂයන්ට හරකළ යුතු රු.399,346ක	දීර්ඝ කාලයක් පාවිච්චි කළ හැකි හා ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කරන භාණ්ඩ මුදල ගැන	වියදම් නිවැරදිව වර්ගීකරණයකර ගිණුම්ගත කළ යුතු ය.

	වියදමක් ප්‍රාග්ධන වැය විෂයන්ට හරකර තිබුණු අතර, තවත් පුනරාවර්තන වැය විෂයකට හරකළ යුතු රු.505,737ක වියදමක් මූලධන වැය විෂයකට හරකිරීමෙන් පුනරාවර්තන වැය විෂයේ රු.327,032ක අධිවැයක් හෙවත් අතිරික්තයක් වළකාගෙන තිබුණි.	නොසලකා මෙතෙක් කාලයක් හර කරනු ලැබුවේ ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වන අතර, ඉදිරියේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කරන බව දන්වා තිබුණි.	
(ආ)	වැය විෂයන් 04ක් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් අරමුණු සඳහා වැය විෂයන් 05කට වෙන්කර තිබුණු එකතුව රු.40,000,000ක ප්‍රතිපාදන අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව මු.රෙ. 66 මගින් මාරුකර ගැනීම හේතුවෙන් එම ප්‍රතිපාදනවලින් සියයට 21 සිට සියයට 91 දක්වා එකතුව රු.60,339,195ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	E-Land, E-Pop, EMBD ව්‍යාපෘති සඳහා ආපදා ප්‍රතිෂ්ඨාපන දත්ත මධ්‍යස්ථානයක් (DR Site) මිලදී ගැනීමට රුපියල් මිලියන 50ක් ඇස්තමේන්තුකර තිබුණ ද, දැනට දෙපාර්තමේන්තුවේ තිබෙන Server Upgrade කිරීම මගින් එම අවශ්‍යතාවය සපුරාගත හැකි බව තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් නිර්දේශ වී තිබීම හේතුවෙන් රු.46,400,934ක මුදල් ඉතිරි වී ඇති බවත්, 2024 වර්ෂයේ ඇස්තමේන්තු මගින් සලසා දී තිබූ ප්‍රතිපාදන මුදල් අවසන්වීම මත මෙම මු.රෙ. 66 මාරුකිරීම මගින් ප්‍රතිපාදන සලසාගනු ලැබූ බවත් දන්වා තිබුණි.	අවශ්‍යතා පරිදි ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හැකිවන පරිදි නිසිපුරෝකථනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	වැය විෂය 254-01-01-1102 සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.500,000න් රු.400,000ක් වෙනත් වැය විෂයකට මාරුකිරීමෙන් අනතුරුව රු.100,000 ඉතිරියක් පැවතිය ද, එය සියයට සියයක්ම උපයෝජනය නොකර ඉතිරිකර තිබුණු අතර, වැය විෂය 254-01-02-1102 සඳහා වෙන්කර තිබුණු රු.500,000ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි.	විදේශ ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන ඇස්තමේන්තුගත කළ ද, රජයේ විදේශ ගමන් සීමාකිරීම හේතුවෙන් ප්‍රතිපාදන වියදම් නොවූ බව දන්වා තිබුණි.	අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයන් 14ක් සඳහා වෙන්කරන ලද රු.235,700,000ක ප්‍රතිපාදනවලින් රු.72,614,083ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු අතර, එම වැය විෂයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 11 සිට සියයට 78ක පරාසයක් ගෙන තිබුණි.	2023 වර්ෂයේ පැවති මිලගණන් මත 2024 ඇස්තමේන්තු සකස්කර ඇති බැවින්, ඉන්ධන වැනි වැය විෂයන්වලට අදාළව 2024 වර්ෂයේ දී මිලගණන් අඩුවීම, විදුලි කප්පාදුව අඩුවීම මත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල ජෙනරේටර් භාවිතය අඩුවීම	අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු ය.

	රජයේ ප්‍රතිපත්ති මත විදේශ ගමන් අත්හිටුවීම, අතිකාල සීමාකිරීම හා රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමාකිරීම, කාර්යක්ෂම හා ඵලදායී ලෙස වියදම් කළමනාකරණය කිරීම මත එසේ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	

3.3 බැරකම් හා බැදීම්වලට එළැඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 10 දින සිට 2025 ජනවාරි 09 දක්වා කාලය පරිච්ඡේදයට අදාළව ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු.540,000ක් බැරකම් යටතේ දක්වා තිබුණි.	අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සඳහන් වී ඇති බව දන්වා තිබුණි.	බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් පිළියෙල කළ යුතු ය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 17කට අදාළව බැරකම් ලේඛනයේ සටහන්කර තිබුණු රු.30,434,279ක් වූ බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනය සමග ඉදිරිපත්කර ඇති බැරකම් ප්‍රකශනයට රු.12,050,471ක් ලෙස රු.18,383,808ක් අඩුවෙන් ද, වැය විෂයන් 03කට අදාළව බැරකම් ලේඛනයේ සටහන්කර තිබුණු රු.503,583ක් වූ බැරකම් වටිනාකම බැරකම් ප්‍රකාශනයේ රු.2,973,424ක් ලෙස රු.2,469,841ක් වැඩියෙන් ද දක්වා තිබුණි.	ගිණුම් ප්‍රකාශනය 2025 පෙබරවාරි 24 දිනට ඉදිරිපත් කළ යුතු වූ බැවින් බැරකම් ලේඛනයේ ඇතුළත් 2025 ජනවාරි 30 දක්වා ඇති බැරකම් පමණක් ගිණුම් ප්‍රකාශනයට ඇතුළත්කර ඇති බව දන්වා තිබුණි.	නිතිපතා බැරකම් සටහන්කර බැරකම් ලේඛනය නිවැරදිව පවත්වාගත යුතු ය.

3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
බිම් සවිය මිලදීගැනීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙන් වැය විෂය	බිම් සවිය මිලදීගැනීම් සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙන් ලබාදුන්	දෙපාර්තමේන්තු අධිකාරී බලය තුළ ඉටු කළ හැකි කාර්යයන්

122-02-03-04-2509 යටතේ ලබා දී තිබුණු රු.206,743,567ක ප්‍රතිපාදනවලින් වැඩසටහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.104,885,556ක් පමණක් වැයකර තිබුණු අතර ඉතිරිය රු.101,858,011ක් විය. ඒ අනුව භාවිතයට ගෙන තිබුණු ප්‍රතිපාදනය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50.7ක් වූ පහළ අගයක් විය.	ප්‍රතිපාදනවලින් හිමිකම් කාර්යාල සඳහා පරිගණක වැඩසටහන් සකස්කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රසම්පාදන කාර්යය උපදේශනාත්මක ප්‍රසම්පාදන කාර්යයක් වූ බැවින් දෙපාර්තමේන්තුවේ වියදම් සීමාව ඉක්මවා ඇස්තමේන්තුගත කළ ප්‍රසම්පාදන කාර්යයක් බැවින් එම කටයුතු සිදුකිරීමට දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බැවින් එම කාර්යය අමාත්‍යාංශය වෙත පවරන ලදී. නමුත් භාණ්ඩාගාරය මගින් ඉඩම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන නැවත පවරාගැනීම හේතුවෙන් එම ප්‍රසම්පාදන කාර්යය සිදුකිරීමට නොහැකි විය. එබැවින් එම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි.	සඳහා පමණක් ප්‍රතිපාදන සලසාගෙන කටයුතු කළ යුතු ය.

3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	දැනට එම කටයුතු සිදුකරගෙන යන බැවින්, ඉදිරියේ දී එම ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කරන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.6 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13.9 වගන්තිය	-	මූලික විමර්ශන නිලධාරියා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීම වඩාත් උචිත බව දක්වා ඇතත්, මූලික විමර්ශන නිලධාරින් ලෙස සංවර්ධන නිලධාරින් පත්කිරීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින බැවින්, විමර්ශන කටයුතු කාර්යක්ෂමව නිමකිරීමේ දූර්වලතාවයන් පවතී.	මූලික විමර්ශන සිදුකිරීම සඳහා නිලධාරින් නොමැති වීම හේතුවෙන්, සංවර්ධන නිලධාරින් විමර්ශන අංශය වෙත අනුයුක්තකර ඔවුන් පුහුණුකර විමර්ශන සිදු කරන බව දන්වා ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වඩාත් සුදුසු සහ කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිතකර මූලික විමර්ශන කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	(i) මු. රෙ. 113(3)	1,968,066	වංචාවක් හෝ පවතින ක්‍රමයේ දෝෂයක් නොමැති නම් පමණක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට රජයේ ආදායමින් අත්හැරීම් සිදුකළ හැකි වුවත්, වසර ගණනාවක සිට අයකර ගැනීමට	පනත අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවරනු ලබන සමථ මුදල් අයකර ගැනීමට හෝ එම මුදල අහෝසි කිරීමට ද රෙජිස්ට්‍රාර් ජනරාල්ට බලයක් ඇති බව දක්වා ඇත.	රාජ්‍ය ආදායම හෝ රජයට ලැබිය යුතු ගාස්තු අයකර ගැනීමේ හිමිකම්පෑම අත්හැර දැමීම මු.රෙ. 108(ඇ)(ii) ප්‍රකාරව පමණක් සිදුකළ යුතු ය.

			කටයුතු නොකළ හිඟහිටි ආදායමක් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියෙන් තොරව ගණන්දීමේ නිලධාරියා විසින් පොත්වලින් ඉවත්කර තිබුණි.		
	(ii) මු. රෙ. 113(4)	-	ගාස්තු හෝ අයකර ගැනීම් අත්හැර දැමීමට අවසරදීමට නිකුත් කරන සෑම ලිපියකම පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද යැවිය යුතු වුවත්, එම වාර්තා පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර නොතිබුණි.	ගාස්තු හෝ අයකර ගැනීමේ බලධාරියා රෙජිස්ට්‍රාර් ජනරාල් බැවින් විගණකාධිපති වෙත පිටපත් යොමු නොකළ අතර, ඉදිරියේදී විගණකාධිපති වෙත පිටපත් ඉදිරිපත් කිරීමට පියවරගන්නා බව දන්වා ඇත.	මු.රෙ. 113(4) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වන බැවින්, නිසිකළට එම වාර්තා ඉදිරිපත් කළ යුතු ය.
(ඇ)	2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 ඡේදය	-	නවසිගාස් වෙබ්යෙදුම් පද්ධතියෙන් ලබාගත් SA-40 හා බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය ආකෘති (ඇමුණුම iii) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි.	බැඳීම් හා බැරකම් ලේඛනය සිගාස් පරිගණක පද්ධතියට ඇතුළත් කළ ද, එහි පැවති තාක්ෂණික දෝෂයක් හේතුවෙන් බැඳීම් හා බැරකම් ලේඛනය උඩුගත වී නොතිබුණු බැවින් නව සිගාස් වෙබ්යෙදුම් පද්ධතිය මගින් ලබාගන්නා SA-40 හා බැඳීම් බැරකම් පිළිබඳ ප්‍රකාශනය ආකෘති (ඇමුණුම iii) ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දක්වා ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය.

(ඇ)	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීති අංක 2310/29 දරන 158 වැනි රීතිය -	සෑම වර්ෂයක ම ජනවාරි 01 හා ජූලි 01 වන දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනය යාවත්කාලීනකර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එය ප්‍රසිද්ධ කිරීමට කටයුතුකර නොතිබුණි.	2025.01.01 දිනට යාවත්කාලීනකර ඇති බව.	කොමිෂන් සභා කාර්යපටිපාටික රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.7 අත්තිකාරම් නිකුත්කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව නිශ්චිත කාර්යයක් සඳහා ලබාගන්නා තත්කාර්යය අතුරු අග්‍රිමය එම කාර්යය නිමකළ විගසම පියවිය යුතු ය. එසේ වුව ද, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරින් 18දෙදෙනෙකු විසින් අවස්ථා 22ක දී ලබාගෙන තිබුණු එකතුව රු.1,868,904ක අතුරු අග්‍රිම පියවීම දින 7ක සිට දින 73ක් දක්වා කාලයක් ප්‍රමාදකර තිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගෙන ඇත. ඉදිරියේ දී මෙවැනි ප්‍රමාදවීම් සිදුනොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	අත්තිකාරම් නියමිත කාලය තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම්, නිශ්චල සහ චංචල දේපළවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරන ලිපිලේඛන ලියාපදිංචිය, සංරක්ෂණය කිරීම සහ සහතික පිටපත් නිකුත්කිරීමේ ජනතා කේන්ද්‍රීය සේවා සම්පාදනයේ පෙර	මේ සඳහා මෙම වාර්තාවේ 4.2, 4.5, 5, 6, හා 7 මගින් ලබාදී ඇති පිළිතුරුම අදාළ වන බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත්කර ගැනීමට අවශ්‍ය පරිදි සැලසුම් සකස්කර කාර්යයන් විධිමත් කළ යුතු ය.

ගමන්කරු වශයෙන් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, නිශ්චල හා චංචල දේපළවලට අදාළ නෛතික ලේඛන ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ වැදගත් අවස්ථා වන විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීම, එම ලේඛන සංරක්ෂණය කිරීම සහ ඉල්ලීම මත ඒවායේ සහතික කරන ලද පිටපත් නිකුත්කිරීම සහ එමගින් ජනතාවට සිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහායවීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුව ද, මෙම වාර්තාවේ 4.2, 4.5, 5, 6 සහ 7 යන ඡේදයන්හි දක්වා ඇති කරුණු අනුව දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය හා කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටු වී නොතිබුණි.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ඊ - ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන (e – Land Registry Program) දෙපාර්තමේන්තුවේ කටයුතුවලට හා වෙනත් පාර්ශවයන්ගේ අවශ්‍යතාවයන් සඳහා, ඉඩම් ලේඛන පරීක්ෂා කිරීමේ කටයුතු මාර්ගගතව සිදුකිරීමට පහසුකම් සැලසීමට හා ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ මෙම වැඩසටහන ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු 2016 වර්ෂයේ සිට සිදුකළ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එයින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවී නොතිබුණි.	මෙම අදියර I හා II දැනට නියමු කාර්යාල හතරක ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහි III වන අදියර තවමත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී නොමැති අතර, අදියර III ද කාර්යාලවල ක්‍රියාත්මක කරවීමෙන් පසුව මෙහි ප්‍රතිලාභ මහජනතාවට ලබාගත හැකි බව දන්වා තිබුණි.	අපේක්ෂිත අරමුණු ළගාකර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු ය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තොරතුරු තාක්ෂණ අංශය සතුව පැවති සැම්සුම් වර්ගයේ ප්‍රින්ටර්ස් 03ක්, කැනොන් වර්ගයේ හා ලෙක්ස්මාර්ක් වර්ගයේ ප්‍රින්ටර්ස් 02ක් සහ කලර් ප්‍රින්ටර්ස් 01ක් අස්ථාන ගතවී ඇති බව 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගෙන තිබුණු අතර, 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී ඒවා අතරින් සැම්සුම් වර්ගයේ ප්‍රින්ටර්ස් සියල්ලම කැලි වශයෙන් පවතින බවත්, ඉතිරි ඒවා විනාශ කළ යුතු බවටත් නිර්දේශ ලබා දී තිබුණි. ඒ අනුව වත්කම් පරිහරණයේ දී අක්‍රමිකතා සිදුවීමේ ඉඩකඩ පවතින බවත්, රජයේ දේපළ ආරක්ෂිතව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිතකර නොතිබුණි.	අලුත්වැඩියා තොරතුරු නිසිලෙස ලේඛනගතව නොතිබීම මත, නිවැරදි තොරතුරු සොයාගැනීමට ඇති වූ අපහසුතාවය හේතුවෙන්, නිසිකාලසීමාව තුළ අපහරණය කිරීම සඳහා ඒවා නිකුත්කිරීම් නියෝග සමග සැපයුම් අංශය වෙත යොමුකළ නොහැකි වී ඇති අතර, ඉදිරියේදී ලිපිලේඛන ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි.	රජයේ දේපළ ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු ය.

4.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පැවති අංක KA-8957 දරන වාහනය 2022 ජනවාරි 20 දින අනතුරකට භාජනය වීම හේතුවෙන් රු.1,735,950ක අලාභයක් ඇස්තමේන්තුකර තිබූ අතර, එහි අලුත්වැඩියා කටයුතුවලින් අනතුරුව රු845,205ක මුදලක් පමණක් රක්ෂණාවරණය ලෙස ලැබී තිබුණි. එමනිසා රු.890,745ක ශුද්ධ අලාභයක් දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණු අතර,	මු.රෙ. 104 පරීක්ෂණය මේ වන විට සිදුකර ගෙන යනු ලබන අතර, ඉදිරි මාස 02 ඇතුළත එම කටයුතු නිමකිරීමට හැකි බව දන්වා තිබුණි.	අලාභය කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය.

මු.රෙ. 104 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතුකර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 ඡේදය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය සහ ඉල්ලා අස්වූ/සේවයෙන් පහකළ නිලධාරින්ගෙන් අයවිය යුතුව පැවති රු.3,700,210ක ණයශේෂය තුළ මාස 03ක සිට වසර 20ක් දක්වා කාලයක් ගතවී තිබුණු රු.2,672,109ක ණයශේෂ 2025 මැයි 29 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	මියගිය නිලධාරින්ගේ ණයශේෂ මරණ පාරිතෝෂිතයෙන් ද, විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණයශේෂ විශ්‍රාම වැටුපෙන් ද, වැඩ තහනම් නිලධාරින්ගේ ණය කඩිනමින් ගෙවන ලෙස දැනුවත් කිරීමෙන් ද, සේවය හැරගිය නිලධාරින්ගේ ණයශේෂ සඳහා ඇපකරුවන් වෙත ද කඩිනමින් ණය නිරවුල් කරන ලෙස ලිපි යවා ඇති බව දන්වා තිබුණි.	හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13 වන වගන්තිය අනුව කිසියම් රජයේ නිලධාරියෙක් හෝ නිලධරයන් කිහිපදෙනෙකු හෝ විසින් සිදුකර ඇති විෂමාචාරයක් සම්බන්ධයෙන් මූලික විමර්ශනයන් අප්‍රමාදව සිදුකළ යුතු වුව ද, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා මූලික විමර්ශන නිලධාරින් පත්කිරීමට වර්ෂයකටත් අධික කාලයක් ගතකර තිබුණි. එමෙන්ම මූලික විමර්ශන නිලධාරින් පත්කළ ද, මූලික විමර්ශන කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් චූදිත නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිඡේදයේ 19 වන වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව විනය පරීක්ෂණ කටයුතු කාර්යක්ෂමව නිමකිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිතකර නොතිබුණි.	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි ලද විට මූලික විමර්ශන සිදු කිරීමට පෙර විමර්ශන සිදු කර එයින් අනාවරණය වන කරුණු අනුව මූලික විමර්ශන කටයුතු සිදුකිරීම අවශ්‍ය වන අවස්ථාවල දී මූලික විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා මූලික විමර්ශන නිලධාරින් පත් කර මූලික විමර්ශන සිදුකරනු ලබන අතර, පරීක්ෂණ සිදුකර පරීක්ෂණ වාර්තා අවධානයට යොමුකර ඒ අනුව මූලික විමර්ශන සිදුකිරීමට තීරණය කෙරෙන විට ගත වන කාලය අනුව මූලික විමර්ශන නිලධාරින් පත්කිරීමට ගතවන කාලය ද වෙනස් වන බව දන්වා තිබුණි.	විනය පරීක්ෂණ කටයුතු කාර්යක්ෂමව නිමකිරීමට ප්‍රමාණවත් හා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.

(ඇ)	නාරම්මල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කා.කා.සේ. III සේවකයෙකු විසින් වංචනික ක්‍රියාවල නිරතවීම සම්බන්ධයෙන් 2022 ජනවාරි 25 දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත පැමිණිල්ලක් යොමුකර තිබුණු අතර, 2025 මැයි මාසය අවසන්වන තුරුත් එම සේවකයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2025 මාර්තු 19 දින අදාළ නිලධාරියා වෙත ලඝු විනය යටතේ විනය ක්‍රියාමාර්ග ගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇති බව දන්වා තිබුණි.	විනය ක්‍රියාමාර්ග විධිමත් කිරීමට සහ කඩිනම් කිරීම සඳහා සතුටුදායක අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.
(ඈ)	මහර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක සේවයේ සේවකයන් විසින් කාර්යාල කටයුතුවලට බාධා වන අන්දමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් 2022 ජූනි 15 දින ලැබී තිබුණු පැමිණිල්ලක් සම්බන්ධයෙන් 2024 වර්ෂය අවසන් වන විටත් විමර්ශන කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වා තිබුණි.	විනය ක්‍රියාමාර්ග විධිමත් කිරීමට සහ කඩිනම් කිරීම සඳහා සතුටුදායක අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.
(ඉ)	ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 17(ආ) වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 267 හා 268 වන දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව, ලියාපදිංචිය සඳහා ලැබෙන ඔප්පු/ලේඛන දින 21ක් ඇතුළත දී ලියා පදිංචි කිරීම අවසන් කළ යුතු වුව ද, මහජනයා විසින් සාමාන්‍ය සේවා යටතේ ලියාදිංචිය සඳහා දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට බාර දී තිබුණු ඔප්පු විශාල සංඛ්‍යාවක් නියමිත කාලවකවානුව තුළ ලියාපදිංචි කිරීමට කටයුතුකර නොතිබුණි.	නිවාඩු දිනවල ද කාර්යාලය විවෘත කර ඔප්පු ලියාපදිංචි කිරීමේ කටයුතු යථාවත්කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	නිලධාරින්ගේ එදිනෙදා රාජකාරී කටයුතු යාවත්කාලීන වන පරිදි පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතු ය.
(ඊ)	නොතාරිස් ආඥාපනතේ 31 වන වගන්තියේ සඳහන් රීති නිසිපරිදි අනුගමනය කරමින් නොතාරිස්වරුන් විසින් අඩුපාඩු රහිතව ලේඛන ඉදිරිපත් කර තිබේ ද යන්න පරීක්ෂාකර භාරගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ස්ථාපිතකර නොතිබීම හේතුවෙන් ලේඛනවල අඩුපාඩු පරීක්ෂා කිරීම ලියාපදිංචි කටයුතු භාර විෂය ලිපිකරුවන් විසින්ම සිදුකළ යුතු බැවින් එය ලේඛන	ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතට අනුව ලියාපදිංචි කිරීම සඳහා ලේඛන භාරගැනීමේ දී එම අඩුපාඩු පරීක්ෂා කිරීම ලේඛන භාර ගැනීමේ නිලධාරියාට අයත් රාජකාරියක් නොවන අතර, ඉදිරිපත් කරන සෑම ලියවිල්ලක්ම එම නිලධාරියා විසින් භාරගැනීම සිදුකළ යුතු බව දන්වා තිබුණි.	ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂම කළ යුතු ය.

	ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට බාධාවක් වී තිබුණි.		
(උ)	දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2024 දක්වා ලියාපදිංචිය අවසන්කර මාස හයක් ගත වී තිබුණු ඔප්පු 2,352ක් පැවතිය ද, 1927 අංක 23 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ V වන පරිච්ඡේදයේ 28(2)(අ) වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල් අත්පොතේ 315(අ) වගන්තිය ප්‍රකාරව අදාළ පාර්ශවයන් වෙත ආපසු භාරදීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට අවශ්‍ය පියවරගත යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් අනවශ්‍ය පරිදි ලේඛන රාශියක් කාර්යාලය තුළ ඒකරාශී වී තිබුණි.	කවර සහිතව තිබූ ඔප්පු මේ වනවිටත් තැපැල්කර අවසන්කර ඇති අතර, ඉතිරි ඔප්පු සම්බන්ධව මේ වන විට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතු ය.
(ඌ)	නොතාරිස් අඥාපනතේ 31(26), ලේඛන ලියාපදිංචි කිරීමේ අඥාපනතේ 4(1), (2) හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 374(1) හා 375 යන වගන්තිවල සඳහන් විධිවිධාන ප්‍රකාරව නොතාරිස්වරුන් විසින් තමා සාක්ෂි දැරූ ඔප්පුවල දෙවන පිටපත් සියල්ල ඔප්පු ලියා අත්සන් කළ මාසයට පසුව එළැඹෙන මාසයේ 15 වැනි දිනට පෙර, අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදිය යුතු වුව ද, 2023 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් දක්වා කාලයට අදාළව දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඔප්පු පිටපත් භාරදිය යුතු නොතාරිස්වරුන් 72දෙනෙකු විසින් ලියන ලද ඔප්පු දෙවන පිටපත් 1,162ක් භාරදී නොතිබුණි. මෙසේ ඔප්පු දෙවන පිටපත් භාරනොදීම නිසා නොතාරිස්වරයා විසින් ඔප්පු හිමි පාර්ශවයන්ගෙන් අයකරන මුද්දර ගාස්තුව නිසිපරිදි රජයට ගෙවා තිබේ ද යන්න සනාථකරගත නොහැකි විය.	කාර්ය මණ්ඩලයේ හිඟතාවය මේ වනවිටත් සම්පූර්ණ වී නොමැත. නමුත් පරීක්ෂා කිරීමේ කටයුතු කරගෙන යනු ලබන අතර, මුද්දර ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත් මුල් පිටපත ලියාපදිංචි කරන විටදී ලබාදීම අනිවාර්යය බව දන්වා තිබුණි.	පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතු අතර මනාපසුවිපරම් ක්‍රියාවලියක් ඇති කළ යුතු ය.
(එ)	රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 375 වගන්තිය ප්‍රකාරව ඊළඟ මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම ඔප්පු දෙවන පිටපත් හෝ හිස් වාර්තා එවීම පැහැර හරින නොතාරිස්වරුන් සම්බන්ධයෙන් වහාම	මෙම කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් යෙදවීමට නොහැකිවීම මත මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, නොතාරිස් අංශයටම සිටින්නේ එක් කාර්යාල	වගකීම් පැහැර හරින නොතාරිස්වරුන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතු ය.

	විධිහීනතා වාර්තා පිළියෙළකර ඉදිරි පියවර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, 2023 වර්ෂයේ හා 2024 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නොතාරිස්වරුන් 62දෙනෙකු විසින් ඔප්පු දෙවන පිටපත් ද, නොතාරිස්වරුන් 06ක් විසින් හිස්වාර්තා ද ඉදිරිපත් කිරීම ප්‍රමාද කර තිබුණ ද, ඔවුන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කාර්ය සහයකවරයෙකු පමණක් වුව ද, නොතාරිස්වරු 62 හා 06දෙනා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	
(ඒ)	2022, 2023 සහ 2024 යන වර්ෂයන් සඳහා දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට, ඔප්පු දෙවන පිටපත් භාරදීම පැහැර හැර ඇති නොතාරිස්වරුන්ට විධිහීනතා වාර්තා යවා නොතිබුණු බැවින් රෙජිස්ට්‍රාර් ජනරාල් අත්පොතේ 375(9) වගන්තිය ප්‍රකාරව දඩ අයකිරීමට හෝ නඩු පැවරීමට හෝ ඇති අවස්ථා මගහැරී තිබුණි.	මෙම කටයුතු සඳහා කාර්යාල කාර්ය සහයකයන් එක්අයෙක් පමණක් ඇති අතර, 2022 වර්ෂයේ විධිහීනතා සකස්කිරීම අවසන් අදියරේ පවතී. 2022, 2023න් කොටසක් විධිහිනතා අවසන්කර ඇති අතර, සැලකිය යුතු විධිහීනතා ප්‍රමාණයක් කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යවා ඇති බව දන්වා තිබුණි.	පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.
(ඔ)	රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 22 වගන්තිය ප්‍රකාරව ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් තම දිස්ත්‍රික්කයේ එක් එක් නොතාරිස්වරයා වෙනුවෙන් නොතාරිස්වරයාගේ වරදවල් පිළිබඳ ලේඛනය ද, නොතාරිස්ගේ පත්වීම්, විධිහීනතා වාර්තා, රාජකාරී අවසානවීම යනාදී කරුණු පිළිබඳ සියලුම තොරතුරු ඇතුළත් විධිමත් පෞද්ගලික ලිපි ගොනුවක් තබාගත යුතු වුව ද, විගණනට ඉදිරිපත් කළ ලිපිගොනු විවිධ අඩුපාඩු සහිතව පවත්වාගෙන ගොස් තිබුණි.	නොතාරිස් පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වුව ද, 2023 සිට නව ගොනු සම්පූර්ණ ගොනු ලෙස පවත්වාගෙන යාමට කටයුතුකර ඇති අතර, පැරණි ගොනුවල අඩුපාඩු නොතාරිස්වරුන්ට සම්පූර්ණකර දෙන ලෙස දන්වා තිබුණි.	නොතාරිස්වරුන්ගේ පෞද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.
(ඕ)	දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට 2022 වර්ෂයේ සිට 2024 දක්වා ලැබී තිබුණු ඔප්පු දෙවැනි පිටපත් 165,540ක් 117 වැනි අධිකාරිය වන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වැනි වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 548 වැනි වගන්තිය ප්‍රකාරව වෙළුම් කිරීමට කටයුතුකර නොතිබුණි. තව ද, ලේඛනාගාරය තුළ අවිධිමත් ලෙස	2022 වර්ෂයේ දෙවැනි පිටපත් තේරීම් කරමින් තාවකාලික පිටපත් කිරීම ආරම්භකර ඇති බව දන්වා තිබුණි.	ලේඛන ආරක්ෂා කිරීමට කඩිනම් පියවරගත යුතු ය.

	ලේඛන තැන්පත්කර තිබීම හේතුවෙන් සහ පෙර වර්ෂවලට අදාළව නොතාරිස්වරුන් විසින් ඉදිරිපත් කළ යුතු සියලුම ලේඛන ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් 2022 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයන්ට අදාළව සියලුම ලේඛන ස්ථිර හෝ තාවකාලික වෙළුම් ලෙස ගොනුකර නොතිබුණි.		
(ක)	නොතාරිස් ආඥාපනතේ 31(23) වගන්තිය ප්‍රකාරව අන්තිම කැමතිපත්‍ර සහ ඌණ පූර්ණපත්‍ර ද ඇතුළුව තමා ඉදිරිපිට ලියා අත්සන් කරන හෝ පිළිගනු ලබන ලේඛන ඒවා ලියා අත්සන් කරන හෝ පිළිගනු ලබන අනුපිළිවෙලට අනුගාමී පූර්ණ සංඛ්‍යා යෙදීමෙන් අංකකර නොතාරිස්වරයා විසින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, ඇතැම් නොතාරිස්වරුන් විසින් එකම අංකයෙන් ඔප්පු 02ක් හෝ 03ක් ලියා තිබූ අවස්ථා ද, A හා B ලකුණු භාවිතා කර තිබූ අවස්ථා ද තිබුණි. එසේ නොතාරිස් ආඥාපනතේ 31 වගන්තියේ දක්වා ඇති රීති පිළිපැදීම සහ ඒවාට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින නොතාරිස්වරුන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	එකම අංකවලින් ලියන ලද ඔප්පු දිවුරුම් ප්‍රකාශ සහිතව ලියාපදිංචි කිරීම සිදුකරනු ලබයි. A, B වැනි අක්ෂර යොදා සකස්කරන ඔප්පු ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන බව දන්වා තිබුණි.	වගකීම් පැහැර හරින නොතාරිස්වරුන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.
(ග)	දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මාසිකව රු.375,000ක් බැගින් රු.4,500,000ක වාර්ෂික කුලියක් ගෙවා බාහිර පාර්ශවයකගේ ගොඩනැගිල්ලක ඉහළ මාලයේ කුළී පදනම මත පවත්වාගෙන යන අතර ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිවීම, නඩත්තු කටයුතු නිසිපරිදි සිදුනොවීම හේතුවෙන් ලේඛනාගාරයක් තුළට වැසිජලය කාන්දුවීම හා සිවිලිම වේයන්ගේ ග්‍රහණයට හසු වී තිබීම කාර්යාල කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට තර්ජනයක් විය.	ලේඛනාගාරයේ වහළය කෝට්ටේ නගර සභාව මගින් වැසිජලය කාන්දුවීම වැළැක්වීමට පිළියම් යොදවන ලද බව දන්වා තිබුණි.	ගොඩනැගිල්ලෙහි නඩත්තු කටයුතු කඩිනමින් සිදුකළ යුතු ය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර තුළින් ඉතා පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය වන අතර, එය සාක්ෂාත්කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුව විසින්, • නිශ්චල හා චංචල දේපළවලට අදාළ ලේඛන, ඇටෝර්නි බලපත්‍ර, නිශ්චල දේපළවලට අදාළ හිමිකම් හා සිවිල් ලියාපදිංචි කිරීම. • භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය • සහතික පිටපත් නිකුත්කිරීම වශයෙන් ප්‍රධාන කාර්යයන් තුනක් යටතේ ක්‍රියාකාරකම් ඉටුකිරීමට සැලසුම්කර තිබුණ ද, හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සලකා බැලීමේ දී සිවිල් ලියාපදිංචි කිරීම පමණක් පදනම් කරගෙන තිරසර සංවර්ධන අරමුණු ගොඩනගා ඇති බව නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුවේ ඉතිරි කාර්යයන් සඳහා ද තිරසර සංවර්ධන අරමුණු ගොඩනැඟීමේ කටයුතු මේ දිනවල සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ සමස්ත දැක්ම හා මෙහෙවරට අදාළ අරමුණු ළඟාකර ගැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ගොඩනැගිය යුතු ය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
නොතාරිස් ආඥා පනතේ 31 වගන්තියේ සඳහන් පරිදි නොතාරිස්වරුන් විසින් ඉඩම් ඔප්පු ලිවීමේදී පිළිපැදිය යුතු රීති අනුගමනය නොකර වැරදි අඩුපාඩුකම්	2023 වර්ෂවල රපෝර්තු ලේඛනය යාවත්කාලීනකර ඇත. මේ වන විට 2024 වර්ෂයේ කටයුතු යාවත්කාලීන කරමින් පවතින	අඩුපාඩු රහිතව ලියන ලද ඔප්පු පමණක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට භාර

සහිතව ලියා සහතිකකර ලියාපදිංචි කිරීම සඳහා දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට 2021, 2022, 2023, සහ 2024 යන වර්ෂයන්හිදී භාරදුන් ඉඩම් ඔප්පු පිළිවෙලින් 84ක්, 313ක්, 711ක් සහ 995ක් බැගින් ඔප්පු 2,103ක් ඒවායේ වැරදි නිවැරදි නොකිරීම හේතුවෙන් ලියාපදිංචි කිරීමට නොහැකිව විෂය ලිපිකරු වෙත රඳවාගෙන තිබුණි.	අතර, එය අවසන් වූ පසු 2021 වර්ෂයේ කටයුතු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ගැනීමට කටයුතු කළ යුතු ය.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 2842 ක් වූ අනුමත කාර්යමණ්ඩලයෙන් 238ක් පුරප්පාඩු වී පැවති අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරු 12ක් ද, තෘතීයික මට්ටමට අයත් තනතුරු 82ක් ද, ද්විතීක මට්ටමට අයත් තනතුරු 124ක් ද, ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 20ක් ද ඒ අතර විය. රෙජිස්ට්‍රාර් ජනරාල් සේවයේ විවිධ තනතුරු 57ක් දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින අතර, එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර පහළ තනතුරුවල නිලධාරින් වැඩ ආවරණය සඳහා යොදවා තිබුණි.	අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු දෙක සඳහා බඳවාගැනීමේ පටිපාටියේ ඇති සුදුසුකම් සපුරා ඇති නිලධාරින් නොමැතිවීම නිසා, එම තනතුරු පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව පවතින සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 3ක් කුසලතා පදනම මත බඳවාගැනීම සඳහා රා.කො.ස. අනුමැතිය ලැබී ඇති අතර, විභාග දැන්වීම ගැසට් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර, විභාගය පැවැත්වීම සඳහා දිනය විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාදීමට නියමිත ය. තව ද, පුරප්පාඩුව පවතින අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු 34ක් අතරින් 17ක් බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් 2021 වසරේ පවත්වන ලද විභාගයේ ලකුණු මත සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් සිදුකර ඇත. අනෙකුත් තනතුරු 17	කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම කඩිනම් කළ යුතු ය.

		බඳවාගැනීමේ විභාගයේ ගැසට් නිවේදනය නිරීක්ෂණ සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි.	
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත සංවර්ධන නිලධාරි තනතුරු සංඛ්‍යාව 400ක් වුව ද, එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 1,704ක් වූ අතර, 2025 ජනවාරි 29 දින තනතුරු 1,298ක් සඳහා අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2025 මැයි 31 දින වන විට තවදුරටත් තනතුරු 406ක් අතිරික්තව පැවතුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1190/Vol.III දරන 2025.01.29 දිනැති ලිපිය මගින් සංවර්ධන නිලධාරි තනතුරු 1,298ක් සඳහා අනුමැතිය ලබා දී ඇති බව දන්වා තිබුණි.	අනුමත සීමාවන් යටතේ පමණක් කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට වග බලාගත යුතු ය.
(ඇ)	දෙපාර්තමේන්තුවේ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරෙහි වර්තමානයේ රාජකාරී ඉටුකරන නිලධාරියා පත්කර දැනට වසර 05කට ආසන්න කාලයක් ගත වී ඇතත්, එම තනතුර සඳහා දැනට සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරින් ස්ථිරව පත්කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණකර නොතිබුණි. පවතින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 2ක සඳහා පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා නිලධාරින් අනුයුක්තකර තිබෙන අතර, එම තනතුරු සඳහා දැනට සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරින් ස්ථිරව පත්කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණකර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් උසස්කිරීම් හා පත්කිරීම් ක්‍රියාවලිය නිසිකළට නියමිත පරිදි ඉටුනොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බවත්, ඒ හේතුවෙන් තවත් වසර 05කට අධික කාලයක් ගත වුවත්, මෙම තනතුරු සඳහා ස්ථිර පත්කිරීම් කිරීමට නොහැකිව සේවා පළපුරුද්ද රහිත සුදුසුකම් නොලත් නිලධාරින්ව තවදුරටත් මෙලෙස රාජකාරී ඉටුකිරීම සඳහා පත්කිරීමට සිදු වී ඇත.	අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු දෙක සඳහා බඳවාගැනීමේ පටිපාටියේ ඇති සුදුසුකම් සපුරා ඇති නිලධාරින් නොමැතිවීම නිසා එම තනතුරු සඳහා සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර ඇත. මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා සේවා ව්‍යවස්ථාව නැවත සමාලෝචනය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වා තිබුණි.	පත්කිරීම්, උසස්කිරීම් නියමිත කාලවකවානු තුළ සිදුකර සුදුසුකම්ලත් නිලධාරින් බිහිකිරීමට කටයුතු කළ යුතු ය.